

# RB ORCHID

## සඳහා සම්පූර්ණ

# මාර්ගෝපදේශය

RB ORCHID

Creating Elegance

# 1 පැළය නිවසට ගෙන ඒම

## ඇසුරුම ඉවත් කරන්න



ඔබ ආර්බී ඕකිඩ් පැළයක් මිලදී ගන්නා විට, එය පොලිතින් ආවරණයක් සමග පැමිණේ. මෙය මල් හෝ කොළ වලට සිදුවන හානිය වළක්වා ගැනීමට භාවිතා කරන අතර එය ප්‍රවේශමෙන් මල් වලට හානියක් නොවන ලෙස ඉවත් කරගන්න.

## ආලෝකය



හොඳින් ආලෝකමත් පරිසරයක ඕකිඩ් වැඩෙයි. ඔබේ ඕකිඩ් දීප්තිමත් හා ආලෝකමත් කාමරයක හෝ උතුරු හෝ නැගෙනහිර දෙසට මුහුණලා ඇති ජනේලයක් අසල තබන්න. නමුත් සෘජු හිරු එළියට නිරාවරණය වීම වලක්වන්න. ඔබ ශාකය හරිතාගාරයක් තුළ තබන්නේ නම්, 60% සෙවන දැලක් භාවිතා කරන්න.

## උෂ්ණත්වය



අංශක 18 ත් 35 ත් අතර උෂ්ණත්වයක් ඕකිඩ් පැළයට යෝග්‍ය වේ.

## ආර්ද්‍රතාවය




50% හෝ ඊට වැඩි ආර්ද්‍රතාවයක් යටතේ පැලනොප්සිස් හොඳින් වර්ධනය වේ.

## ජලය



ඔබේ ආර්බී ඕකිඩ් වලට වතුර දැමීම ඉතා පහසුයි. ඔබට අවශ්‍ය වන්නේ සතියකට වරක් වතුර කෝප්පයක් පමණි. ඔබ නළ ජලය භාවිත කරන්නේ නම්, ජලය කෝප්පයකට ගෙන දිනක් පමණ තබා ඔබේ පැළය සඳහා භාවිත කරන්න. මෙමගින් ජලයේ ඇති ක්ලෝරීන් වාෂ්ප වී යන අතර, ඔබගේ පැළයට එය හිතකර වේ.

# 2 පැවැත්මට සහාය වීම

## ජලය

සම්පූර්ණ ප්‍රමාණයේ පැලනොප්සිස් ඕකිඩ් පැළයක් සඳහා ඔබට අවශ්‍ය වන්නේ සතියකට වරක් වතුර කෝප්පයක් පමණි.

## මුල්

- හොඳින් ජලය දැමූ මුල් හරිත පැහැයෙන් යුක්ත වේ
- අළු / සුදු මුල් වලින් පෙන්නුම් කරන්නේ වැඩි ජලය ප්‍රමාණයක් අවශ්‍ය බවයි.
- දුඹුරු හෝ කුණු වූ මුල් අධික ලෙස ජලය දැමීමේ ලකුණකි.
- ඔබ අධික ලෙස ජලය යොදා ඇත්නම්, මාධ්‍යය වියළී යන තෙක් ඔබේ ශාකයට ජලය දැමීම නවත්වන්න. ඒවා වියළී නොයන්නේ නම්, පැළයේ මල් පිපීම අවසන් වන තුරු රැඳී සිටින්න. ඉන්පසු කුණු වූ මුල් කපා ඉවත් කර අලුත් මාධ්‍යයක බඳුන්ගත කරන්න.

## ශාක පත්‍ර

නිරෝගී ශාකයක පත්‍ර දැඩි බවකින් හා දීප්තිමත් කොළ පැහැයෙන් යුක්ත විය යුතුය. වෙනත් වර්ණවල තේරුම.



**කහ** - අවශ්‍ය ප්‍රමානයට වඩා ආලෝකය, අඩු උෂ්ණත්වය, මූල කුණුවීම හෝ මකුළු මයිටාවන්ගේ හානි. ශාකයක පහල කොටසේ ඇති පත්‍ර  කහ පැහැයට හැරී වැටීම සාමාන්‍ය දෙයකි. නව පත්‍ර වර්ධනය වීමේදී පහල ඇති පත්‍ර හැලී යයි.



**සුදු** - අවශ්‍ය ප්‍රමානයට වඩා ආලෝකය ලැබීම.



**දම් පාට** - හිරු එළියට අධික ලෙස නිරාවරණය වීම සහ විජලනය වීම.



**තද කොළ** - ප්‍රමානවත් ආලෝකයක් නොලැබීම.



**මැලවීම** - ප්‍රමාණවත් තරම් ජලය නොලැබීම.



**කළු** - බැක්ටීරියා හෝ දිලීර වර්ධනය, අධික පොහොර හෝ ජලයේ ඇති ඛනිජ ද්‍රව්‍ය තැම්පත් වීම.

## පොහොර

- ඔබේ ශාකය මල් පිපී අවසන්වී විවේකයෙන් සිටියදී සතියකට වරක් පොහොර යොදන්න.
- නයිට්‍රජන්, පොස්පරස් සහ පොටෑසියම් (ලේබලයේ 20-20-20) සමාන අනුපාතයන්ගෙන් ඇති පොහොර භාවිතා කරන්න. ලේබලයේ දක්වා ඇති උපදෙස් අනුගමනය කරන්න

## ජලයේ බැසයෑම

- ඔබේ අලංකාර බඳුනේ ඉතිරි වී ඇති  අතිරික්ත ජලය ඉවත් කරන්න. බඳුනේ ජලය රැඳී තිබීම නිසා මුල් කුණු වී ඔබගේ පැළය මිය යා හැක.

# 3 නැවත බඳුන්ගත කිරීම

## කවදාද?

සෑම වසරකට හෝ දෙකකට වරක්, ඔබේ ඕකිඩ් විවේක අවධියේදී නැවත බඳුන්ගත කරන්න. මාධ්‍ය බිඳවැටෙමින් තිබේ නම්, අප්‍රසන්න ගඳක් දැනේ නම් හෝ මුල් පද්ධතිය එහි බහාලුම ඉක්මවා ගොස් තිබේ නම් ඔබට නැවත බඳුන්ගත කිරීමක් අවශ්‍ය විය හැකිය.

නිසි ලෙස ප්‍රතිකාර නොකළ මාධ්‍ය භාවිතා කිරීමෙන් ඔබේ ශාකය මිය යා හැකිය. හොඳම ප්‍රතිඵල සඳහා, RB ඕකිඩ් නැවත බඳුන්ගත කිරීමේ කට්ටලය භාවිතා කරන්න.

## කොහොමද?

- මල් නටුව තවමත් කොළ පැහැති නම්, පිරිසිදු කතුරකින් පළමු මල තිබූ ස්ථානයට පහළින් ඇති නිරෝගී නෝඩයකට අඟල් 1 ක් පමන ඉහළින් මල් නටුව කපා දමන්න. මල් නටුව දුඹුරු හෝ කහ පැහැතිනම්, මල් නටුව ශාකයට සම්බන්ධ වී ඇති ස්ථානයේ සිට අඟල් 1ක් පමන ඉහළින් කපන්න. නෝඩයන් මල් තිබූ ස්ථානයට පහළින් කඳේ කුඩා ත්‍රිකෝණයක් මෙන් පෙනේ.

- ඕකිඩ් පැළය වගා බඳුනෙන් ඉවත් කරන්න.

- දුඹුරු, මෘදු හෝ මියගිය මුල් පිරිසිදු කතුරකින් කපන්න. (නිරෝගී මූලයන් කොළ, සුදු සහ ඝන බවකින් යුක්තය.)

- පැළය නව වගා බඳුනක තබන්න. පහළම පත්‍රයේ පාදම දාරයේ සිට අඟල් භාගයක් පමණ ඉහළින් තිබිය යුතුය. බඳුනෙන් ප්‍රමාණවත් ලෙස ජලය බැසයාම සඳහා පතුලේ සිදුරු සහිත වගා බඳුනක් තෝරාගන්න.

- බඳුනට නව මාධ්‍ය එක් කරන්න. මාධ්‍යයවල වායු හිඩැස් නොමැති බවට වග බලා ගන්න.



මල් නටුව තවමත් කොළ පැහැති නම්, පිරිසිදු කතුරකින් පළමු මල තිබූ ස්ථානයට පහළින් ඇති නිරෝගී නෝඩයකට අඟල් 1 ක් පමන ඉහළින් මල් නටුව කපා දමන්න.



මල් නටුව දුඹුරු හෝ කහ පැහැතිනම්, මල් නටුව ශාකයට සම්බන්ධ වී ඇති ස්ථානයේ සිට අඟල් 1ක් පමන ඉහළින් කපන්න.



දුඹුරු, මෘදු හෝ මියගිය මුල් පිරිසිදු කතුරකින් කපන්න.



බඳුනට නව මාධ්‍ය එක් කරන්න. මාධ්‍යයවල වායු හිඩැස් නොමැති බවට වග බලා ගන්න.

# 4 මල් පිපී අවසන් වූ පැළ නඩත්තුව

## කවදාද?

මල් පිපී අවසන් වූ පසු, නැවත මල් පිපෙන තුරු කාලය තුළ පහත උපදෙස් පිළිපදින්න.

## කෙසේද?

- සතිපතා ජලය දැමීම දිගටම කරගෙන යන්න.
- සෑම සතියකම සමාන අනුපාත සහිත (20-20-20) පොහොර යෙදීම.
- එයට 40% ආලෝකය දෙන්න.
- නව මල් කිනිත්තක් වර්ධනය වීමට මාස 9-12 ක් ගතවනු ඇත.

## විවේක අවස්ථාවේ ශාක හා මියගිය අවස්ථාවේ ශාක

මුල් පරීක්ෂා කරන්න. විවේක අවස්ථාවේ ඇති ශාක වල මූලයන් කොළ හෝ සුදු පැහැ වන අතර, ඝන ස්වරූපයක් ගනී. ඔබගේ ශාකයේ කොළ සියල්ල හැලී කඳ කුණු වී ඇත්නම්, ඔබේ ඕකිඩ් ශාකය මිය ගොස් ඇති අතර එය ඉවත් කර අලුත් පැළයක් සඳහා යාමට කාලයයි.

# 5 නැවත මල් පිපීමට දිරිමත් කිරීම

## කවදාද?

සියලූ මල් හැලී ගිය පසු හා, තවමත් මල් නටුව කොළ පැහැතිව ඇති විට.

## කොහොමද?

රැඳී සිටිමින් ප්‍රවේශය බලන්න. ඕකිඩ් පැරණි මල් නටුවේ අවසානයේ නව අංකුර නිපදවිය හැකිය.

## එසේ නොවේ නම්,

- තනි මල් කිනිත්තක් සහිත පැළ සඳහා, මල් නටුවේ පළමු මල පිපුනු ස්ථානයට යටින් ඇති නිරෝගී නෝඩය අඟල් 1 ක් ඉහළින් කපන්න.
- ද්විත්ව මල් කිනිති සහිත ශාක සඳහා, එක මල් නටුවක ශාකයේ පාමුල සිට අඟල් 1 ක් ඉහළින් කපා, අනෙක් මල් නටුව පළමු මල පිපුන ස්ථානයට යටින් ඇති නිරෝගී නෝඩයට අඟල් 1 ක් ඉහළින් කපන්න.
- මල් කිනිත්ත දුඹුරු නම්, ශාකයේ පාදයට අඟලක් පමන ඉහළින් කපා දමන්න.



රැඳී සිටිමින් ප්‍රවේශය බලන්න. ඕකිඩ් පැරණි මල් නටුවේ අවසානයේ නව අංකුර නිපදවිය හැකිය.



මල පිපුන ස්ථානට යටින් ඇති නිරෝගී නෝඩයට අඟල් 1 ක් ඉහළින් කපන්න.



මල් කිනිත්ත දුඹුරු නම්, ශාකයේ පාදයට අඟලක් පමණ ඉහළින් කපා දමන්න.